ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
බාහිර විභාග අංශය
BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA
EXTERNAL EXAMINATION BRANCH

# විභාග පරීක්ෂණ කටයුතු පිළිබඳ ව්‍යවස්ථාව

## 1.0 පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ නීතිරීති :-

1.01. විභාග අපේක්ෂකයන් නියමිත ප්‍රශ්න පත්‍රය ඇරඹීමට විනාඩි 15 කට කලින් විභාග ශාලාව වෙත පැමිණිය යුතු අතර, විභාග ශාලාධිපති දැනුම් දුන්විට විභාග ශාලාව තුළට පිවිසිය යුතුය.

1.02. විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළට පිවිසි වහා ම තමාගේ අංකය දරණ අසුනෙහි වාඩි විය යුතුය.

1.03. විභාග අපේක්ෂකයන් තමන්ගේ ප්‍රයෝජනය සඳහා පෑන්, පැන්සල්, තීන්තකුඩු, මකන රබර් කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් යන ආදී වශයෙන් නීත්‍යානුකූලව අවසර ලබා දී ඇති අවශ්‍ය උපකරණ පමණක් රැගෙන ආ යුතුය. මීට අමතර ව පරීක්ෂණයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනයට ගතහැකි කිසිම ලියවිල්ලක් හෝ සටහනක් හෝ උපකරණයක් තමා විසින් හෝ තමා වෙනුවෙන් අන් අයෙකු විසින් හෝ විභාග ශාලාව තුළට නොගෙනෙන බවට වග බලා ගත යුතුය.

1.04. පරීක්ෂණය ආරම්භ වී, විනාඩි 30 කට පසු ව කිසිම විභාග අපේක්ෂකයෙකු ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. පරීක්ෂණය ආරම්භ වී විනාඩි 30 ක් ගත වීමට ප්‍රථම මෙන් ම, පරීක්ෂණය අවසන් වීමට විනාඩි 15 කට කලින් ද විභාග අපේක්ෂකයන්ට ශාලාවෙන් පිටවීමට අවසර දෙනු නොලැබේ.

1.05. සියලු ම විභාග අපේක්ෂකයන් ස්වකීය පරීක්ෂණ ප්‍රවේශ පත්‍රය සහ ශිෂ්‍ය වාර්තා පුස්තකය, අනන්‍යතා පත්‍රය හෝ හැඳුනුම් පත්‍රය විභාග ශාලාවට රැගෙන පැමිණිය යුතුය. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය වාර්තා පුස්තකයෙහි හා අනන්‍යතා පත්‍රයෙහි අපේක්ෂකයාගේ ඡායාරූපය හා අත්සන තිබිය යුතු අතර, ලේඛකාධිකාරී හෝ ඔහුගේ බලයලත් නිලධාරියකු විසින් එය සහතික කොට තිබිය යුතුය. ශිෂ්‍ය වාර්තා පුස්තකයෙහි/ අනන්‍යතා පත්‍රයෙහි නම හා විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් නම අතර කිසියම් වෙනසක් ඇත්නම්, ඒ බවට ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. එබඳු සහතිකයක් ඉදිරිපත් නොකරන අවස්ථාවක දී අපේක්ෂකයාගේ ජාතික හැඳුනුම් පත්‍රය හෝ මෑතක දී ගත් අපේක්ෂකයාගේ ඡායාරූපයක් බලයලත් පුද්ගලයෙකු විසින් සහතික කොට ඉදිරිපත් කළ යුතුය.

1.06. විභාග ශාලාධිපති විසින් ඉල්ලා සිටි අවස්ථාව දී විභාග අපේක්ෂකයන් තමා භාරයේ හෝ තමා ළඟ හෝ ඇති ඕනෑම ලිපි ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් ඉදිරිපත් කළ යුතුය.

1.07. කිසිම විභාග අපේක්ෂකයෙකු තවත් විභාග අපේක්ෂකයෙකුගෙන් කිසියම් දෙයක් ඉල්ලා ගැනීම හෝ හුවමාරු කර ගැනීම හෝ කතා බස් කිරීම හෝ කොපි කිරීම හෝ නොකළ යුතුය. වෙනත් විභාග අපේක්ෂකයෙකුගෙන් කොපි කිරීම හෝ වෙනත් අපේක්ෂකයෙකුට කොපි කිරීමට අනුබල දීම හෝ උපකාර කිරීම ද නොකළ යුතුය.

1.08. නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා එදිනට නිකුත් කරන ලද ලියන පොත් හා කඩදාසි පමණක් යොදා ගත යුතුය.

1.09. පිළිතුරු ලිවීම සඳහා අවශ්‍ය කරන ලිපිද්‍රව්‍ය අවශ්‍ය වන පරිදි විභාග අපේක්ෂකයින් වෙත නිකුත් කරනු ලැබේ. තමාට දෙන ලද කිසිදු කඩදාසියක් හෝ ලියන පොතක් ඉරීම, සූරා දැමීම, නැමීම, පොඩිකිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර දැමීම හෝ නොකළ යුතුය. ශාලාධිපති /නිරීක්ෂක විසින් දෙන ලද ලිපිද්‍රව්‍ය පමණක් පාවිච්චි කළ යුතු අතර, තමා වෙත සපයන ලද සියලු ම ලිපිද්‍රව්‍ය හා උපකරණ (පාවිච්චි කළ හෝ නොකළ) ස්වකීය මේසය මත ම තබා යා යුතු අතර, විභාග ශාලාවෙන් පිටත ගෙනයාම නොකළ යුතුය.

1.10. පිළිතුරු ලිවීමට පෙර, තමාට අයත් සංකේත සහිත පරීක්ෂණාංකය හා පරීක්ෂණයේ නම පැහැදිලි ලෙස පිළිතුරු පතෙහි නියම තැන ලිවිය යුතුය. පිළිතුරු ලිවීමට යොදා ගන්නා අනෙකුත් සියලු ම කඩදාසිවල ද ස්වකීය විභාග අංක යොදා තිබිය යුතුය. කිසිම විභාග අපේක්ෂකයකු ස්වකීය නම හෝ වෙනත් හඳුනා ගැනීමේ සළකුණු යනාදිය පිළිතුරු පත්‍රවල නොලිය යුතුය. කෙනෙකුගේ පිළිතුරු පත්‍රයක වෙනත් විභාග අංකයක් යෙදීම පරීක්ෂණ විෂමාචාරයක් ලෙස සළකනු ලැබේ.

1.11. කටුවැඩ ආදිය සඳහා යොදා ගන්නා ලද කඩදාසි හා ලියන කඩදාසි ද පිළිතුරු පත්‍රය සමග අමුණා තැබිය යුතුය. එහෙත් පිළිතුරු පත්‍රයට අනවශ්‍ය කොටස් පැහැදිලි සේ, ඉරිගසා කපා දැමිය යුතුයි. ප්‍රවේශ පත්‍රයේ, කාලසටහනේ හෝ ප්‍රශ්න පත්‍රයෙහි යනාදියෙහි කටුවැඩ නොකළ යුතුයි.

1.12. සියලු ම විභාග අපේක්ෂකයින් පරීක්ෂණ ශාලාධිපතිට ද, නිරීක්ෂකවරුන්ට ද, අනෙකුත් අපේක්ෂකයින්ට ද, බාධා හෝ හිරිහැර නොවන සේ හැසිරිය යුතුයි. පරීක්ෂණ ශාලාව තුළ හා අවට නිශ්ශබ්දව සිටිය යුතුය.

1.13. කිසිම විභාග අපේක්ෂකයෙකු, තමා විසින් ම ලියන ලද පිළිතුරු පත්‍රයක් ප්‍රායෝගික හෝ ක්ෂේත්‍ර පොතක් හෝ වැඩසටහනක් හෝ නිබන්ධනයක් මිස, මුලුමනින් ම හෝ කොටසක් හෝ අන්‍ය තැනැත්තෙකු විසින් සකස් කරන ලද්දක් ඉදිරිපත් නොකළ යුතුයි.

1.14. කිසිම අපේක්ෂකයෙකු තමා වෙනුවෙන් වෙනත් කෙනෙකුට පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවසර නොදිය යුතු අතර, වෙනත් කෙනෙකු වෙනුවෙන් පෙනී සිටීමට ද කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැත.

1.15. විභාග ශාලාවේදී උද්ගතවන ඕනෑම කරුණක් වෙනුවෙන් ම විභාග අපේක්ෂකකුගෙන් ලිඛිත ප්‍රකාශයක් ලබා ගැනීමට ශාලාධිපතිට හා නිරීක්ෂකවරුන්ට බලය තිබේ. එවැනි ප්‍රකාශයක් කිරීම හෝ එයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතුයි.

1.16. ස්වකීය පිළිතුරු පත ශාලාධිපතිට හෝ නිරීක්ෂකවරයකුට හෝ සියතින් ම භාරදිය යුතුයි. එමෙන් ම පිළිතුරු පත් එකතු කරන තෙක් සිය අසුනේ ම හිඳගෙන සිටිය යුතුයි. කවර කරුණක් නිසාවත්, ඔබගේ පිළිතුරු පත, පරීක්ෂණ ශාලාවෙහි සේවකයෙකුට හෝ වෙනත් කෙනෙකුට භාර නොදිය යුතුයි.

1.17. පරීක්ෂණයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනයට ගත හැකි කිසි ම ලියවිල්ලක් හෝ සටහනක් හෝ උපකරණයක් තමන් වෙත නොමැති බවට සෑම විභාග අපේක්ෂකයකු ම වගබලා ගත යුතුය. තව්ද කිසි ම උපකරණයක් හෝ ලියවිල්ලක් හෝ සටහනක් හෝ අනිසි අන්දමින් තම ප්‍රයෝජනයට ගැනීමට වෑයම් නොකළ යුතුයි. පරීක්ෂණ විෂමාචාරයක යෙදෙන බවට හෝ යෙදී ඇති බවට සැකයක් මතුවිය හැකි සෑම ක්‍රියාවකින් ම වැලැකීමට සෑම අපේක්ෂකයෙකු ම වග බලාගත යුතුය.

1.18. සෙලියුලර් දුරකථන හා එබඳු සන්නිවේදන උපකරණ භාවිතා කිරීම, ළඟතබා ගැනීම, විනයානුකූල ව දඬුවම් ලැබිය හැකි වරදක් බැවින් එවැනි දෙය ළඟ තබා ගැනීමෙන් වැළකිය යුතුය.

## 2.0 පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම

2.01. අසනීප නිසා මුළු පරීක්ෂණයට හෝ පරීක්ෂණ කොටසකට පෙනී නොසිටි/ නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව පරීක්ෂණ ආරම්භ වීමට ප්‍රථම හෝ පරීක්ෂණ පැවැත්වෙන කාලසීමාව තුළ හෝ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

2.02. නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් තමා පදිංචි ප්‍රදේශයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියාගෙන් හෝ රජයේ ආරෝග්‍ය ශාලාවක උපදේශක වෛද්‍යවරයෙකුගෙන් හෝ ලබාගත් වලංගු වෛද්‍ය සහතිකයක් අදාළ පරීක්ෂණය හෝ කොටස පැවැත්වීමට නියමිත දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුයි. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික පිළිගනු නොලැබේ.

**3.0 විභාග අක්‍රමිකතා මතු දක්වෙන ආකාරයට කෙටියෙන් වර්ග කර ඇත**

3.01. බල නොලත් ලිපි ලේඛන ආදී සන්තකයෙහි තබා ගැනීම.
3.02. කොපි කිරීම.
3.03. වංචා කිරීම.
3.04. විශ්වවිද්‍යාලයට අයත් විභාග ලිපි ද්‍රව්‍ය ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම.
3.05. අනිසි හැසිරීම.
3.06. විභාගාපේක්ෂකයකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම.
3.07. ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැනගැනීම හෝ දැනගැනීමට තැත් කිරීම.
3.08. යම් විභාග වරදක් කිරීමට ආධාර හෝ අනුබල දීම හා ලබා ගැනීම.
3.09. විභාග පරීක්ෂකවරුන්ට හෝ අනිකුත් විභාග නිලධාරීන්ට අයුතු බලපෑම් කිරීම.
3.10. සනාතන සභාව විසින් විභාග අක්‍රමිකතාවයක් ලෙස සැළකෙන වෙනත් ඕනෑම අක්‍රමිකතාවයක්.

**4.0. විභාග අක්‍රමිකතා පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රමය**

විභාග අක්‍රමිකතා පිළිබඳ ව විභාග ශාලාධිපති විසින් විභාග පිළිබඳ සහකාර ලේඛකාධිකාරීට වාර්තා කළ යුතුය. ඒ ඒ වර්ෂවල පරීක්ෂණ අක්‍රමිකතා සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා සනාතන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීමට සනාතන සභාව මගින් පත් කරනු ලබන අනු කමිටුවට එකී අක්‍රමිකතා පිළිබඳ ව අදාළ ලිපි ලේඛන සමඟ විභාග පිළිබඳ සහකාර ලේඛකාධිකාරී විසින් වාර්තා කළ යුතුය. අනතුරු ව කමිටුව නිර්දේශයන් සනාතන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. සනාතන සභාව මගින් කරනු ලබන දඬුවම් එකී අපේක්ෂකයන්ට පනවනු ලැබේ.

**5.0. විභාග අක්‍රමිකතා සඳහා දඬුවම්**

5.01. **බල නොලත් ලිපි ලේඛන ආදිය සන්තකයෙහි තබා ගැනීම.**
විභාග අපේක්ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් වර්ෂ 2 කට විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පමුණුවීම.

5.02. **කොපි කිරීම.**
විභාග අපේක්ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් වර්ෂ 3 කට විශ්වවිද්‍යාලයේ ඕනෑම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි දඬුවම් පමුණුවීම.

5.03. **වංචා කිරීම.**
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි අවම වශයෙන් හා උපරිම වශයෙන් කිසියම් කාලයකට විශ්වවිද්‍යාල පරීක්ෂණ තහනම් කිරීම හා වෙනත් දඬුවම් පමුණුවීම.

5.04. **විශ්වවිද්‍යාලයට අයත් විභාග ලිපි ද්‍රව්‍ය ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම.**
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම හා සනාතන සභාව මගින් නියම කරනු ලබන කාල සීමාවකට විශ්වවිද්‍යාලයේ ඕනෑම පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීම.

5.05. **අනිසි හැසිරීම.**
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම හා අවුරුදු 5 කට නොවැඩි කාලයකට විශ්වවිද්‍යාලයේ ඕනෑම පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන වෙනත් ඕනෑම දඬුවමක්.

5.06. **විභාගාපේක්ෂකයකු තමන් වෙනුවෙන් පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම.**
විභාග අපේක්ෂකත්වය අවලංගු කොට, වර්ෂ 5 කට නොඅඩු හා වර්ෂ 10 කට නොවැඩි කාලයකට විශ්වවිද්‍යාලයේ ඕනෑම පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන වෙනත් ඕනෑම දඬුවමක්.

5.07. **ප්‍රශ්න පත්‍රයක ඇතුලත් ද අයථා පරිදි දැනගැනීම හෝ දැනගැනීමට තැත් කිරීම.**
විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන වෙනත් ඕනෑම දඬුවමක්.

5.08. **යම් විභාග වරදක් කිරීමට ආධාර හෝ අනුබල දීම සහ ලබා ගැනීම.**
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන වෙනත් ඕනෑම දඬුවමක්.

5.09. **විභාග පරීක්ෂකවරුන්ට හෝ අනිකුත් විභාග නිලධාරීන්ට අයුතු බලපෑම් කිරීම.**
සනාතන සභාවේ අභිමතය පරිදි ඕනෑම දඬුවමක් පැනවීම.

5.10. **යම් විභාග වරදකට දෙවන වරටද වරදකරුවෙකු වීම.**
යම් විභාග වරදකට දෙවන වරට ද වරදකරු වන විභාග අපේක්ෂකයන්ගේ ශිෂ්‍යභාවය අවලංගු කිරීම.

**6.0. අනිවාර්ය දඬුවම්.**

ඉහත සඳහන් වරදවලට නියම කර ඇති දඬුවම්වලට අමතර ව, සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන අනිවාර්ය දඬුවම් මෙසේ ය.

6.01. පන්ති සාමර්ථ්‍යයක් නොදීම.
6.02. අවලංගු කළ ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටීමේදී ලකුණු 40 උපරිමයට සීමා කිරීම.
6.03. උපාධි ප්‍රදානෝත්සවයට නොකැඳවීම.
6.04. උපාධි ප්‍රදානය හා ප්‍රතිඵල නිකුත් කිරීම වර්ෂයකින් ප්‍රමාද කිරීම ආදිය වේ.

**7.0.** මෙහි සඳහන් නැති, සනාතන සභාව මගින් විභාග අක්‍රමිකතාවක් ලෙස පිළිගනු ලබන වෙනත් ඕනෑම වරදකට සනාතන සභාවේ අභිමතය පරිදි දෙනු ලබන දඬුවම් නියම කෙරේ.